අනු අංකය	පාඨමාලා සංකේත	පාඨමාලාවේ නම හා ස්වභාවය අංකය	පැවැත්වෙන තාක්ෂණ/කාර්මික	ඇතුලත්වීමේ සුදුසුකම් වයස අවුරුදු 17ට වැඩිවිය යුතුය
15.	ETC 02	කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතිකය (විදුලි ඉංජිනේරු) පූර්ණ කාල දිවා - දෑවුරුදු	මහනුවර, රත්මලාන	රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක ක්ෂේත්‍රයට අදාලව NVQ මට්ටම 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. *හෝ* අ. පො. ස. (උ. පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ ගණිතය/විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.) සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
16.	ETC 03	කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතිකය (යාන්ත්‍රික ඉංජිනේරු නිෂ්පාදන තාක්ෂණය) පූර්ණ කාල දිවා - දෑවුරුදු	මහනුවර	රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක ක්ෂේත්‍රයට අදාලව NVQ මට්ටම 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. *හෝ* අ. පො. ස. (උ. පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ ගණිතය/විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.) සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

11-591

අධ්‍යාපන අමාත්‍යාංශය

අ. පො. ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම-2015

Recruitment of Graduates to Grade 3 – 1 (a) of Sri Lanka Teachers' Service for Sinhala and Tamil Media Teacher Vacancies existing in the subjects of Bio Systems Technology and Science for Technology of the New Technology Stream of G.C.E. (Advanced Level) – 2015

අ. පො. ස. (උසස් පෙළ) නව තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ තාක්ෂණ විද්‍යාගාර සහිත ද්විතියික පාසල්වල **ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව** යන විෂයයන්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1 යෝග්‍යතා :-

1.1 සාමාන්‍ය සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,
(ii) යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
(iii) **2015.12.21** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය,

1.2 අධ්‍යාපන සුදුසුකම් :

I ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2015.12.21 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන ඉල්ලුම් කරනු ලබන විෂයයට අදාළ උපාධියක් ලබා තිබිය යුතුය,

ඒ අනුව
ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සඳහා ඉල්ලුම් කරන උපාධිධාරීන් කෘෂි විද්‍යා උපාධියක් ලබා තිබිය යුතු අතර,

තාක්ෂණය සඳහා විද්‍යාව විෂයය සඳහා ඉල්ලුම් කරන උපාධිධාරීන් තම උපාධියට **භෞතික විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක්** ලෙස හදාරා තිබිය යුතුය.

II අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පොෂ. (සා.පෙළ) හා අ.පොෂ. (උසස් පෙළ) විභාගය පහත සඳහන් පරිදි සමත්ව තිබිය යුතු ය.

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී අනුයාත වසර 2 ක් තුළ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත්විය යුතු ය,

- අ.පොෂ. (උසස් පෙළ) විභාගයෙන් නව විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වීම.

සටහන.— විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පොෂ. (සා.පෙළ) හා අ.පොෂ. (උසස් පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද ඉල්ලුම් කළ හැකිය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි* :-

2.1 මෙම දැන්වීමට අදාළව පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්ව සිටී නම් ඔවුන් සේවයට බඳවා ගැනීමේ පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන පරිදි විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉදිරියේදී **තරඟ විභාගයක් පවත්වනු ලබන අතර** එමගින් ලබා ගන්නා මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබා දීමට සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

2.2 එමෙන්ම පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විටක නම් **බඳවා ගැනීමේ තරඟ විභාගයක්** පවත්වනු නොලැබේ. මෙහිදී අයැදුම්කරුවන් ගුරු සේවයට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පමණක් මුහුණ දිය යුතු වේ.

2.3 උපලේඛනය 1 හි සඳහන් ගුරු පුරප්පාඩු අතුරින් පාසල් 03 ක් පමණක් එක් අයදුම්කරුවෙක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර තම කැමැත්ත මත ඉල්ලුම් කරනු ලබන පාසල හා එහි අනුපිළිවෙල පසුව වෙනස් කළ නොහැක.

2.4 <u>ප්‍රෙව</u> පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් සඳහා මේ වන විට පළාත් හෝ ජාතික පාසලකට ගුරු පත්වීමක් ලබා දැනට ගුරු සේවයේ නියුතු අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන .-

ඉල්ලුම් කරනු ලබන පාසලේ පවතින විෂයයට අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි ඉල්ලුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති අවස්ථාවකදී තරඟ විභාගයේදී ලබා ගන්නා ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. එකම පාසලට ඉල්ලා ඇති ඉල්ලුම්කරුවන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක පාසලට ඇති දුර ප්‍රමාණය අනුව ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එම නිර්ණායක මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ඇත.

2.5 රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව <u>තෝරා ගනු ලබන අපේක්ෂකයෙක් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ</u>. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2014.12.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (XII) අනුව වන අතර මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය ජී-ඊ-1-2006 දරන වැටුප් බණ්ඩය යටතේ මාසිකව රු. 13,410 -145 x 6 - 180 x 7 - 215 x 2- රු.15,970 /- වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 15,540/- ක මාසික වැටුප මත පිහිටුවනු ලැබේ.

2.6 මෙම පත්වීම් ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2.7 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක : 1885/38, දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 හි සඳහන් විධිවිධාන, අනුව බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදු කරනු ඇත. එමෙන්ම මෙම ගැසට් නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එම අවස්ථා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

03. *අයදුම් කිරීමේ ක්‍රමය* :

3.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතු ය. 1.0 සිට 7.4 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේද 8.0 සිට ඉදිරියට ශීර්ෂ පිළිවෙළින් අනෙකුත් පිටුවලට වන පරිදි තම අයැදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ද අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ.

එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතු ය.

3.2 අයදුම් කරනු ලබන විෂයය හා පාසල් අනුපිළිවෙල කිසිසේත් වෙනස් කරනු නොලබන අතර ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

3.3 **එක් අපේක්ෂකයකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි,**

3.4 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු 240,360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

3.5 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2015.12.21 වැනි දිනට හෝ ඊට පෙර, 'විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ', යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ, **"අ. පො. ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ ජෙව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම-2015"**, ලෙස අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

3.6 සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

3.7 අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ.අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ජායා පිටපත් ද, ලියා පදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

04. *විභාගයට ඇතුළුවීම :-*

4.1 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඒදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

4.2 අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

සටහන .- **අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත්වීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.**

5. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :*

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

6. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :*

6.1 අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයකදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර

ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෙලිවුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ.

7. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :*

7.1 මෙම විභාගය සිංහල, දෙමළ මාධ්‍යයෙන් කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

8. *විෂය නිර්දේශය :*

මෙම විභාගයට නියමිත ප්‍රශ්නපත්‍ර සංඛ්‍යාව දෙකකි. එම ප්‍රශ්නපත්‍ර දෙකම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම අයැදුම්කරුවන් මෙම ප්‍රශ්නපත්‍ර සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ.

01 අභියෝග්‍යතාව - කාලය පැය 01 1/2 යි (ලකුණු 100 යි)

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 60 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

02 සාමාන්‍ය දැනුම - කාලය පැය 01 1/2 යි, (ලකුණු 100 යි)

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 60 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

9, *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 500 කි, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේම නමට ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න, (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.)

10. *අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :*

අයදුම්පත පිරවීමේදී පහත උපලේඛන 1 භාවිතා කරන්න.

උපලේඛන 01

සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු ලේඛනය

ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය

තාක්ෂණය සඳහා විද්‍යාව විෂයය

අනුක්‍රමික අංකය	පළාත	දිස්ත්‍රික්කය	පාසලේ නම	ජෛව පද්ධති තාක්ෂණය පුරප්පාඩු සංඛ්‍යාව		තාක්ෂණය සඳහා විද්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව	
				සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
1	බස්නාහිර	කොළඹ	ගෝතමී බාලිකා විද්‍යාලය,පන්සල පාර, කොළඹ-10	2	0	1	0
2	බස්නාහිර	කොළඹ	දේවි බාලිකා විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, කොළඹ-08	2	0	0	0
3	බස්නාහිර	කොළඹ	ලුම්බිණි විද්‍යාලය, හැව්ලොක් ටවුන්, කොළඹ-05	1	0	1	0
4	බස්නාහිර	කොළඹ	කොතලාවලපුර ම.වි.රත්මලාන	1	0	0	0
5	බස්නාහිර	කොළඹ	කුඩාබුත්ගමුව ශ්‍රී රාජසිංහ වි.කුඩාබුත්ගමුව, මුල්ලේරියාව	1	0	1	0

අනු. අංකය	පළාත	දිස්ත්‍රික්කය	පාසලේ නම	ජෛව පද්ධති තාක්ෂණය පුරප්පාඩු සංඛ්‍යාව		තාක්ෂණය සඳහා විද්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව	
				සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
6	බස්නාහිර	කොළඹ	ශ්‍රී සුනන්දෝපනන්ද නවෝද්‍යා ම.වි.එගොඩ උයන, මොරටුව	1	0	0	0
7	බස්නාහිර	කොළඹ	ශ්‍රී සුභූති ම.ම.වි.බත්තරමුල්ල	1	0	0	0
8	බස්නාහිර	කොළඹ	බෝමිරිය ම.ම.වි.කඩුවෙල	1	0	0	0
9	බස්නාහිර	කොළඹ	සීතාවක ම.ම.වි.අච්ස්සාවේල්ල	2	0	1	0
10	බස්නාහිර	කොළඹ	රාජසිංහ ම.ම.වි.හංවැල්ල	1	0	0	0
11	බස්නාහිර	කොළඹ	සිරිපියරතන ජාතික පාසල,පාදුක්ක	1	0	0	0
12	බස්නාහිර	කොළඹ	හෝමාගම ම.ම.වි.උසාවිය පාර,හෝමාගම	1	0	1	0
13	බස්නාහිර	කොළඹ	මහාමායා බාලිකා විද්‍යාලය,පැපිළියාන පාර, නුගේගොඩ	1	0	0	0
14	බස්නාහිර	කොළඹ	ධර්මරාජ මහා විද්‍යාලය,මාම්පේ,පිළියන්දල	1	0	1	0
15	බස්නාහිර	කොළඹ	මහින්ද රාජපක්ෂ විද්‍යාලය,පිටිපන,හෝමාගම	0	0	2	0
16	බස්නාහිර	කොළඹ	පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලය.පිළියන්දල	0	0	1	0
17	බස්නාහිර	ගම්පහ	ඩී.එස්.සේනානායක වි., මීරිගම	1	0	0	0
18	බස්නාහිර	ගම්පහ	උරාපොල ම.ම.වි.උරාපොල	0	0	1	0
19	බස්නාහිර	ගම්පහ	බණ්ඩාරණායක විද්‍යාලය,ගම්පහ	0	0	2	0
20	බස්නාහිර	ගම්පහ	රත්නාවලී බාලිකා විද්‍යාලය,කොළඹ පාර, ගම්පහ	2	0	0	0
21	බස්නාහිර	ගම්පහ	හේනේගම ම.ම.වි.හේනේගම	1	0	0	0
22	බස්නාහිර	ගම්පහ	කිරිල්ලවල ම.ම.වි.කිරිල්ලවල,කඩවත	0	0	1	0
23	බස්නාහිර	ගම්පහ	කිරිදිවැල ම.ම.වි.කිරිදිවැල	1	0	0	0
24	බස්නාහිර	ගම්පහ	සියනෑ ජාතික පාසල,පලුගම, දොම්පේ	1	0	1	0
25	බස්නාහිර	ගම්පහ	ශ්‍රී සුමංගල ම.වි.ඊරියවැටිය, කැළණිය	1	0	0	0
26	බස්නාහිර	ගම්පහ	ශ්‍රී පඤ්ඥානන්ද ජාතික පාසල, රද්දොළුව, කොටුගොඩ	1	0	0	0
27	බස්නාහිර	ගම්පහ	අල්-මුබාරක් ම.ම.වි.මල්වාන	0	1	0	2
28	බස්නාහිර	ගම්පහ	ශ්‍රී ඥානෝදය ම.ම.වි.දිවුලපිටිය	0	0	1	0
29	බස්නාහිර	ගම්පහ	සෙනරත් පරණවිතාන ම.වි.උඩුගම්පොල	1	0	1	0
30	බස්නාහිර	ගම්පහ	කරුණාරත්න බෞද්ධ විද්‍යාලය,මත්තුමගල,රාගම	0	0	2	0
31	බස්නාහිර	කළුතර	රෙමුණ මහ විද්‍යාලය,අඟුරුවාතොට	1	0	1	0
32	බස්නාහිර	කළුතර	ආනන්ද ශ්‍රාස්ත්‍රාලය,මතුගම	1	0	1	0
33	බස්නාහිර	කළුතර	කටුකුරුන්ද ධර්මපාල ම.වි.කටුකුරුන්ද, කලුතර	1	0	0	0
34	බස්නාහිර	කළුතර	ඕහිඳු ම.ම.වි.අගලවත්ත	1	0	0	0
35	බස්නාහිර	කළුතර	තක්ෂිලා ම.ම.වි.අඟුරුවාතොට පාර, හොරණ	0	0	1	0
36	උතුරු මැද	අනුරාධපුර	මෛත්‍රීපාල සේනානායක ම.වි.,මැදවච්චිය	0	0	1	0
37	උතුරු මැද	අනුරාධපුර	කැබිතිගොල්ලෑව ම.ම.වි.,කැබිතිගොල්ලෑව	2	0	0	0
38	උතුරු මැද	අනුරාධපුර	රුවන්වැලි ම.ම.වි.,හොරොව්පතාන	1	0	0	0
39	උතුරු මැද	අනුරාධපුර	වලිසිංහ හරිස්චන්ද්‍ර ම.වි.අනුරාධපුර	1	0	2	0
40	උතුරු මැද	අනුරාධපුර	විද්‍යාදර්ශ මහා විද්‍යාලය, නොච්චියාගම	2	0	0	0
41	උතුරු මැද	අනුරාධපුර	තඹුත්තේගම ම.ම.වි.,තඹුත්තේගම	2	0	0	0
42	උතුරු මැද	අනුරාධපුර	ගල්නෑව ම.ම.වි.,ගල්නෑව	1	0	0	0
43	උතුරු මැද	අනුරාධපුර	ගන්තිරියාගම මහින්ද ම.වි.,ඉපලෝගම	1	0	0	0
44	උතුරු මැද	අනුරාධපුර	ගල්කිරියාගම ම.ම.වි.ගල්කිරියාගම	1	0	0	0
45	උතුරු මැද	අනුරාධපුර	ශ්‍රී සිද්ධාර්ථ ම.වි.,එප්පාවල	1	0	0	0
46	උතුරු මැද	පොළොන්නරුව	මින්නේරිය ජාතික පාසල,හිඟුරක්ගොඩ	2	0	1	0
47	උතුරු මැද	පොළොන්නරුව	ආනන්ද බාලිකා ජාතික පාසල,හිඟුරක්ගොඩ	0	0	1	0
48	උතුරු මැද	පොළොන්නරුව	මැදිරිගිරිය ජාතික පාසල,මැදිරිගිරිය	2	0	0	0

අනු. අංකය	පළාත	දිස්ත්‍රික්කය	පාසලේ නම	ජෛව පද්ධති තාක්ෂණය පුරප්පාඩු සංඛ්‍යාව		තාක්ෂණය සඳහා විද්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව	
				සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
49	උතුරු මැද	පොළොන්නරුව	රාජකීය ම.ම.වි..පොළොන්නරුව	1	0	0	0
50	උතුරු මැද	පොළොන්නරුව	පලුගස්දමන ම.වි.,පලුගස්දමන, පොළොන්නරුව	1	0	0	0
51	උතුරු මැද	පොළොන්නරුව	විලයාය ම.ම.වි.,අරලගංවිල	1	0	1	0
52	උතුරු මැද	පොළොන්නරුව	වැලිකන්ද ම.ම.වි.වැලිකන්ද	2	0	1	0
53	උතුරු මැද	පොළොන්නරුව	ලීලාරත්න මහසෙන් ම.වි.වැලිකන්ද	1	0	1	0
54	සබරගමුව	රත්තනපුර	ඇහැලියගොඩ ම.ම.වි.ඇහැලියගොඩ	1	0	2	0
55	සබරගමුව	රත්තනපුර	සුමන බාලිකා විද්‍යාලය.,රත්නපුර	1	0	2	0
56	සබරගමුව	රත්තනපුර	සීවලි ම.ම.වි.හිදැල්ලන, රත්නපුර	2	0	0	0
57	සබරගමුව	රත්තනපුර	ගන්කන්ද ම.ම.වි.පැල්මඩුල්ල	2	0	0	0
58	සබරගමුව	රත්තනපුර	බලංගොඩ ආනන්ද මෛත්‍රී ම.ම.වි.බලංගොඩ	1	0	0	0
59	සබරගමුව	රත්තනපුර	රාහුල ම.ම.වි.ගොඩකවෙල	1	0	1	0
60	සබරගමුව	රත්තනපුර	කරවිට ම.ම.වි.,කරවිට, උඩ කරවිට	1	0	1	0
61	සබරගමුව	රත්තනපුර	කලවාන ජාතික පාසල,කලවාන	1	0	1	0
62	සබරගමුව	රත්තනපුර	කොලොන්න ම.ම.වි.,කොලොන්න	1	0	1	0
63	සබරගමුව	රත්තනපුර	විජේරිය සුමන ම.වි.විජේරිය, රක්වාන	1	0	1	0
64	සබරගමුව	කෑගල්ල	එන්.එම්. පෙරේරා ම.ම.වි.යටියන්තොට	1	0	1	0
65	සබරගමුව	කෑගල්ල	දෙහිඕවිට ජාතික පාසල,දෙහිඕවිට	1	0	0	0
66	සබරගමුව	කෑගල්ල	සිරිසමන් ම.ම.වි.,දැරණියගල	1	0	1	0
67	සබරගමුව	කෑගල්ල	පින්දෙණිය විද්‍යාචක්‍රවර්ති ම.ම.වි.,පින්දෙණිය, අටාල	1	0	0	0
68	සබරගමුව	කෑගල්ල	රාජසිංහ ම.ම.වි.,රුවන්වැල්ල	2	0	1	0
69	සබරගමුව	කෑගල්ල	පින්නවල ම.ම.වි.රඹුක්කන	1	0	1	0
70	සබරගමුව	කෑගල්ල	රිවිසඳ ම.ම.වි.උස්සාපිටිය	2	0	0	0
71	සබරගමුව	කෑගල්ල	නගරගිරි ම.වි.හෙම්මාතගම	0	0	1	0
72	සබරගමුව	කෑගල්ල	අල්- අසාර් මුස්ලිම් ම.වි.හෙම්මාතගම	0	1	0	0
73	සබරගමුව	කෑගල්ල	ස්වර්ණජයන්ති ම.වි.කෑගල්ල	1	0	0	0
74	සබරගමුව	කෑගල්ල	ධර්මසිරි සේනානායක ම.වි.තුල්හිරිය	1	0	0	0
75	මධ්‍යම	මහනුවර	හතරලියද්ද ම.ම.වි,හතරලියද්ද	1	0	0	0
76	මධ්‍යම	මහනුවර	නුගවෙල ම.ම.වි.නුගවෙල	1	0	0	0
77	මධ්‍යම	මහනුවර	රණසිංහ ප්‍රේමදාස විද්‍යාලය,හසලක	0	0	1	0
78	මධ්‍යම	මහනුවර	තෙල්දෙණිය ජාතික පාසල,තෙල්දෙණිය	0	0	2	0
79	මධ්‍යම	මහනුවර	මදීනා මුස්ලිම් ම.ම.වි.මඩවල බසාර්	0	2	0	1
80	මධ්‍යම	මහනුවර	හේවාහැට ම.ම.වි.තලාතුඔය	1	0	1	0
81	මධ්‍යම	මහනුවර	බෙරවර්ටිස් විද්‍යාලය,අම්පිටිය	0	0	0	1
82	මධ්‍යම	මහනුවර	පුෂ්පදාන බාලිකා විද්‍යාලය,මහනුවර	1	0	0	0
83	මධ්‍යම	මහනුවර	පේරාදෙණිය ම.ම.වි.පේරාදෙණිය	2	0	1	0
84	මධ්‍යම	මහනුවර	ස්වර්ණජෝති ජාතික පාසල,කිරිබත්කුඹුර	0	0	1	0
85	මධ්‍යම	මහනුවර	වික්‍රමබාහු ජාතික පාසල,ගම්පොළ	1	0	0	0
86	මධ්‍යම	මහනුවර	අනුරුද්ධකුමාර ජාතික පාසල,නාවලපිටිය	1	0	0	0
87	මධ්‍යම	මහනුවර	කදිරේෂන් ම.ම.වි.කොත්මලේ පාර,නාවලපිටිය	0	2	0	1
88	මධ්‍යම	මහනුවර	හින්දු ජාතික පාසල,නුවරඑළිය පාර,පුස්සැල්ලාව	0	1	0	0
89	මධ්‍යම	මහනුවර	අල්-මනාර් ම.ම.වි.හන්දෙස්ස	0	1	0	1
90	මධ්‍යම	මහනුවර	අලවතුගොඩ ම.ම.වි,අලවතුගොඩ	0	0	1	0
91	මධ්‍යම	මාතලේ	රන්ගිරි දඹුල්ල ම.ම.වි.දඹුල්ල	2	0	0	0
92	මධ්‍යම	මාතලේ	නාමිණිඔය ම.ම.වි,විල්ගමුව,මාතලේ	1	0	0	0
93	මධ්‍යම	මාතලේ	ශාන්ත තෝමස් විද්‍යාලය,මාතලේ	1	0	0	0
94	මධ්‍යම	මාතලේ	අජ්මීර් ජාතික පාසල,ඇල්කඩුව පාර, උකුවෙල	0	3	0	2

අනු. අංකය	පළාත	දිස්ත්‍රික්කය	පාසලේ නම	ජෛව පද්ධති තාක්ෂණය පුරප්පාඩු සංඛ්‍යාව		තාක්ෂණය සඳහා විද්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව	
				සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
95	මධ්‍යම	මාතලේ	රජයේ විද්‍යා විද්‍යාලය,නුවර පාර,මාතලේ	1	0	0	0
96	මධ්‍යම	නුවරඑළිය	ගාමිණී ජාතික පාසල,නුවරඑළිය	1	1	0	0
97	මධ්‍යම	නුවරඑළිය	ගාමිණී දිසානායක ජාතික පාසල,නව නගරය, කොත්මලේ	1	0	0	0
98	මධ්‍යම	නුවරඑළිය	ශ්‍රී සුමංගල ජාතික පාසල,නිල්දණ්ඩාහින්න	1	0	1	0
99	මධ්‍යම	නුවරඑළිය	හොල්බෘක් දෙමළ ම.වි.ආගරපතන	0	2	0	0
100	මධ්‍යම	නුවරඑළිය	නොර්වුඩ් දෙමළ ම.වි.නොර්වුඩ්	0	2	0	0
101	මධ්‍යම	නුවරඑළිය	රාගල දෙමළ මහා විද්‍යාලය,හල්ග්‍රාන්ඔය	0	2	0	0
102	මධ්‍යම	නුවරඑළිය	ගිණිගත්හේන මධ්‍ය මහා විද්‍යාලය, ගිණිගත්හේන	0	0	2	0
103	මධ්‍යම	නුවරඑළිය	පොරමඩුල්ල ජාතික පාසල,පොරමඩුල්ල, රිකිල්ලගස්කඩ	0	0	1	0
104	මධ්‍යම	නුවරඑළිය	කේම්බ්‍රිජ් විද්‍යාලය,කොටගල	0	0	0	1
105	ඌව	බදුල්ල	මහියංගන ජාතික පාසල,මහියංගනය	1	0	1	0
106	ඌව	බදුල්ල	මීගහකිවුල ජාතික පාසල,මීගහකිවුල	1	0	0	0
107	ඌව	බදුල්ල	පස්සර ම.ම.වි.පස්සර	1	0	0	0
108	ඌව	බදුල්ල	බදුල්ල ම.ම.වි.බදුල්ල	1	0	0	0
109	ඌව	බදුල්ල	ධර්මාශෝක මහ විද්‍යාලය, බණ්ඩාරවෙල	1	0	0	0
110	ඌව	බදුල්ල	ධර්මපාල ම.වි.බණ්ඩාරවෙල	1	0	0	0
111	ඌව	බදුල්ල	ශ්‍රී ජනානන්ද ජාතික පාසල,කදුරුගමුව, දියතලාව	1	0	0	0
112	ඌව	බදුල්ල	වල්හපුතැන්න ම.ම.වි.වල්හපුතැන්න,හල්දුම්මුල්ල	1	0	0	0
113	ඌව	බදුල්ල	වැලිමඩ ම.ම.වි.වැලිමඩ	1	0	0	0
114	ඌව	බදුල්ල	හපුතලේ දෙමල ම.වි.හපුතලේ	0	2	0	0
115	ඌව	බදුල්ල	සරස්වති ම.ම.වි.මහියංගන පාර, බදුල්ල	0	1	0	2
116	ඌව	බදුල්ල	පස්සර දෙමළ ම.වි.පස්සර	0	2	0	0
117	ඌව	මොණරාගල	වෙල්ලස්ස ජාතික පාසල,හැවෙල්වල, බිබිල	1	0	0	0
118	ඌව	මොණරාගල	මැදගම ජාතික පාසල,මැදගම, බිබිල	2	0	0	0
119	ඌව	මොණරාගල	මහනාම ම.ම.වි.මොණරාගල	1	0	0	0
120	ඌව	මොණරාගල	නිශ්ශංක ම.ම.වි.බඩල්කුඹුර	1	0	0	0
121	ඌව	මොණරාගල	මල්වත්තාවල ම.ම.වි.වැල්ලවාය	1	0	0	0
122	ඌව	මොණරාගල	දුටුගැමුණු ම.ම.වි.බුත්තල	1	0	0	0
123	වයඹ	කුරුණෑගල	පරාක්‍රමබාහු ජාතික පාසල,කොබෙයිගනේ	1	0	1	0
124	වයඹ	කුරුණෑගල	සර් ජෝන් කොතලාවල ම.ම.වි.,දොඩම්ගස්ලන්ද	0	0	1	0
125	වයඹ	කුරුණෑගල	පොතුබෝව ම.වි.	1	0	0	0
126	වයඹ	කුරුණෑගල	සංඝබෝධි ම.ම.වි.,අවුලේගම	1	0	1	0
127	වයඹ	කුරුණෑගල	කුඹුක්ගැටේ ම.ම.වි.	1	0	1	0
128	වයඹ	කුරුණෑගල	එස්.බී.හේරත් ම.ම.වි., ගනේවත්ත,නිකදළුපොත	1	0	1	0
129	වයඹ	කුරුණෑගල	මයුරපාද ම.ම.වි.,නාරම්මල	1	0	0	0
130	වයඹ	කුරුණෑගල	උඩබදලව සුදර්ශන ම.වි.,මාස්පොත	1	0	1	0
131	වයඹ	කුරුණෑගල	හිස්බුල්ලා ම.ම.වි	0	2	0	0
132	වයඹ	කුරුණෑගල	ජේ.ආර් ජයවර්ධන ම.ම.වි.,දුම්මලසූරිය	1	0	1	0
133	වයඹ	කුරුණෑගල	කුලියාපිටිය ම.ම.වි,කුලියාපිටිය	0	0	1	0
134	වයඹ	කුරුණෑගල	සඳලංකාව ම.ම.වි.,හිරිඋල්ල	1	0	0	0
135	වයඹ	කුරුණෑගල	එස්.ඩබ්.ආර්.ඩි. බණ්ඩාරණායක ම.ම.වි.,හෙට්ටිපොල	1	0	1	0
136	වයඹ	කුරුණෑගල	කැකුණගොල්ල මුස්ලිම් ම.ම.වි.	0	2	1	0
137	වයඹ	කුරුණෑගල	බලල්ල ශ්‍රූ.බී.වන්නිනායක ම.වි.,	1	0	0	0
138	වයඹ	කුරුණෑගල	මහසෙන් ජාතික පාසල,නිකවැරටිය	1	0	1	0

අනු. අංකය	පළාත	දිස්ත්‍රික්කය	පාසලේ නම	පෙව පද්ධති තාක්ෂණය පුරප්පාඩු සංඛ්‍යාව		තාක්ෂණය සඳහා විද්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව	
				සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
139	වයඹ	කුරුණෑගල	ශ්‍රී පරාක්‍රම ජාතික පාසල,පොල්ගහවෙල	1	0	0	0
140	වයඹ	කුරුණෑගල	ශ්‍රී රාහුල ම.ම.වි. අලව්ව	1	0	0	0
141	වයඹ	පුත්තලම	ආනමඩුව ම.ම.වි, ආනමඩුව	1	0	1	0
142	වයඹ	පුත්තලම	සහිරා ජාතික පාසල	0	1	0	0
143	වයඹ	පුත්තලම	ආනන්ද ජාතික පාසල,පුත්තලම	0	0	2	0
144	වයඹ	පුත්තලම	සේනානායක ජාතික පාසල,මාදම්පේ	1	0	1	0
145	වයඹ	පුත්තලම	මැදගම අභය ම.වි.,මැදගම	1	0	0	0
146	වයඹ	පුත්තලම	වැකඩ ම.වි., යෝගියාන	1	0	0	0
147	වයඹ	පුත්තලම	ශාන්ත සෙබෙස්තියන් ම.ම.වි.,කටුනේරිය	1	0	0	1
148	දකුණ	ගාල්ල	ආනන්ද ම.ම.වි,ඇල්පිටිය	0	0	2	0
149	දකුණ	ගාල්ල	කරන්දෙනිය ම.ම.වි., කරන්දෙණිය	0	0	1	0
150	දකුණ	ගාල්ල	බටපොල ම.ම.වි., බටපොල	1	0	0	0
151	දකුණ	ගාල්ල	නෙළුව ජාතික පාසල,නෙළුව, ගාල්ල	1	0	1	0
152	දකුණ	ගාල්ල	නාගොඩ රාජකීය විද්‍යාලය,නාගොඩ, ගාල්ල	1	0	1	0
153	දකුණ	ගාල්ල	ශාන්ත අන්තෝනි නවෝදය ම.වි.බද්දේගම	2	0	0	0
154	දකුණ	ගාල්ල	ශ්‍රී සුමංගල ම.වි.නලාගස්දෙනිය, හික්කඩුව	1	0	1	0
155	දකුණ	ගාල්ල	දේවපතිරාජ විද්‍යාලය,රත්ගම	1	0	1	0
156	දකුණ	ගාල්ල	කලහේ ශ්‍රී සුමංගලෝදය ම.වි.කලහේ වංචාවල	1	0	0	0
157	දකුණ	ගාල්ල	රිවඩ් පතිරණ විද්‍යාලය,උලුවිටිකේ, ගාල්ල	1	0	1	0
158	දකුණ	ගාල්ල	කතළුව ම.ම.වි.කතළුව. අහංගම	0	0	1	0
159	දකුණ	ගාල්ල	බටේමුල්ල ජාතික පාසල,ඉමදූව,ගාල්ල	1	0	0	0
160	දකුණ	ගාල්ල	මල්හරැස්සුල්හියා ජාතික පාසල, එච්. කේ. එඩ්මන් මාවත, ගාල්ල	0	1	0	2
161	දකුණ	මාතර	කීර්ති අබේවික්‍රම ජාතික පාසල,දෙනියාය පාර, මොරවක	1	0	2	0
162	දකුණ	මාතර	බෙරලපනාතර ම.වි.බෙරලපනාතර	1	0	1	0
163	දකුණ	මාතර	මලිදුව ම.වි.එරමුදුගොඩ,මලිදුව, අකුරැස්ස	2	0	2	0
164	දකුණ	මාතර	නාරන්දෙණිය ම.ම.වි.කඹුරුපිටිය	1	0	0	0
165	දකුණ	මාතර	මෙතෝදිස්ත ම.ම.වි.හක්මන	1	0	1	0
166	දකුණ	මාතර	දෙයියන්දර ජාතික පාසල,දෙයියන්දර	1	0	1	0
167	දකුණ	මාතර	සිද්ධාර්ථ විද්‍යාලය,වැලිගම	1	0	0	0
168	දකුණ	මාතර	ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය,වැලිගම	1	0	0	0
169	දකුණ	මාතර	අර්ෆා ම.ම.වි.වැලිගම	0	0	0	1
170	දකුණ	මාතර	මාතර ම.ම.වි.රාහුල පාර, මාතර	1	0	1	0
171	දකුණ	මාතර	මහින්ද රාජපක්ෂ ජාතික පාසල, රස්සන්දෙණිය, මාතර	2	0	0	0
172	දකුණ	හම්බන්තොට	හ/වලස්මුල්ල ජාතික පාසල,වලස්මුල්ල	1	0	2	0
173	දකුණ	හම්බන්තොට	රාජපක්ෂ ම.ම.වි., වීරකැටිය	1	0	0	0
174	දකුණ	හම්බන්තොට	හ/ තංගල්ල පිරිමි ජාතික පාසල,තංගල්ල	1	0	0	0
175	දකුණ	හම්බන්තොට	හ/ තංගල්ල බාලිකා ජාතික පාසල,තංගල්ල	1	0	0	0
176	දකුණ	හම්බන්තොට	හ/ ගැටමාන්න විජය ජාතික පාසල,ගැටමාන්න, බෙලිඅත්ත	0	0	1	0
177	දකුණ	හම්බන්තොට	හ/ දෙඔරවැව ම.ම.වි.,දෙඔරවැව, තිස්සමහාරාමය	1	0	1	0
178	දකුණ	හම්බන්තොට	ථේරපුත්ත ජාතික පාසල,වඳුරුඇප්ප පාර, අම්බලන්තොට	0	0	1	0
179	දකුණ	හම්බන්තොට	ශාන්ත මේරි විද්‍යාලය,හම්බන්තොට	1	0	1	0
180	දකුණ	හම්බන්තොට	සහිරා ජාතික පාසල,හම්බන්තොට	0	2	0	0

අනු. අංකය	පළාත	දිස්ත්‍රික්කය	පාසලේ නම	ජෛව පද්ධති තාක්ෂණය පුරප්පාඩු සංඛ්‍යාව		තාක්ෂණය සඳහා විද්‍යාව පුරප්පාඩු සංඛ්‍යාව	
				සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
181	දකුණ	හම්බන්තොට	රුහුණු විජයබා ජාතික පාසල,සිටිනාමළුව, බෙලිඅත්ත	2	0	2	0
182	නැගෙනහිර	මඩකලපුව	මඩ/ඔඩ්ඩමාවඩි ම. ම. වි. ඕඩ්ඩමාවඩි	0	2	0	0
183	නැගෙනහිර	මඩකලපුව	මඩ/වාලච්චේනෙයි අන්නූර් ම. වි.වාලච්චේන	0	2	0	0
184	නැගෙනහිර	මඩකලපුව	මඩ/කිරාන් මහ විද්‍යාලය,කිරන්	0	2	0	0
185	නැගෙනහිර	මඩකලපුව	මඩ/වන්තාරමූලෙයි ම. ම.වි.සිට්ටනඩි- 1	0	2	0	0
186	නැගෙනහිර	මඩකලපුව	මඩ/හින්දු විද්‍යාලය,මඩකලපුව	0	2	0	0
187	නැගෙනහිර	මඩකලපුව	මඩ/ කාත්තන්කුඩ්ඩි ම. ම. වි.වෙරළ මාවත, නව කාත්තන්කුඩි-6	0	2	0	0
188	නැගෙනහිර	මඩකලපුව	මඩ/ කාලුදාවලෙයි මහ විද්‍යාලය,කාලුදාවලයි	0	2	0	0
189	නැගෙනහිර	අම්පාර	පොල්වත්ත මහ විද්‍යාලය,පොල්වගා ජනපදය, අම්පාර	1	0	0	0
190	නැගෙනහිර	අම්පාර	මැදගම මහ විද්‍යාලය,නව මැදගම, මහවැල් ජනපදය	1	0	1	0
191	නැගෙනහිර	අම්පාර	ක/ සමන්තුරෙයි ම.ම.වි.සමන්තුරෙයි	0	2	0	0
192	නැගෙනහිර	අම්පාර	සහිරා විද්‍යාලය,සයින්තමාරුතු	0	2	0	1
193	නැගෙනහිර	අම්පාර	අක්කරෙයිපත්තු මුස්ලිම් ම.ම.වි.අක්කරෙයිපත්තු	0	2	0	1
194	නැගෙනහිර	අම්පාර	අඩ්ඩාලච්චෙන ම.ම.වි.,ප්‍රධාන පාර, අඩ්ඩලච්චේන	0	2	0	0
195	නැගෙනහිර	අම්පාර	ශ්‍රී රාමක්‍රිෂ්ණ විද්‍යාලය,අක්කරෙයිපත්තු	0	2	0	0
196	නැගෙනහිර	ත්‍රිකුණාමලය	අභයපුර ම.වි.අභයපුර,ත්‍රිකුණාමලය	1	0	1	0
197	නැගෙනහිර	ත්‍රිකුණාමලය	විපුලානන්ද විද්‍යාලය,නුවර පාර, ත්‍රිකුණාමලය	1	0	0	0
198	නැගෙනහිර	ත්‍රිකුණාමලය	අග්බෝපුර ම.වි.අග්බෝපුර, කන්තලේ	1	2	1	0
199	නැගෙනහිර	ත්‍රිකුණාමලය	කන්තලේ ම.ම.වි.කන්තලේ	1	0	1	0
200	නැගෙනහිර	ත්‍රිකුණාමලය	මුතූර් ම.ම.වි.නොක්ස් පාර, මුතූර්	0	2	0	0
201	උතුරු	යාපනය	යා/ වේලනායි ම.ම.වි.වේලනායි බටහිර, වේලනායි	0	2	0	0
202	උතුරු	යාපනය	වඩ්ඩු හින්දු විද්‍යාලය,සිතන්කානි	0	2	0	1
203	උතුරු	යාපනය	මනිපේ හින්දු විද්‍යාලය,මානිපේ	0	2	0	2
204	උතුරු	යාපනය	යා/වයාවිලන් ම. ම. වි.වයාවිලන්	0	2	0	0
205	උතුරු	යාපනය	යා/ ශ්‍රී සෝමස් කන්ද විද්‍යාලය,පුතූර්	0	2	0	0
206	උතුරු	යාපනය	යා/ නෙල්ලිඅඩි ම. ම.වි.කරවෙඩ්ඩි	0	2	0	0
207	උතුරු	යාපනය	මෙතෝදිස්ත උසස් බාලිකා විද්‍යාලය,පේදුරුතුඩුව	0	2	0	0
208	උතුරු	යාපනය	චාවකච්චේරි හින්දු විද්‍යාලය,සන්කාත්තානෙයි, චාවකච්චේරිය	0	3	0	2
209	උතුරු	යාපනය	යාපනය හින්දු විද්‍යාලය,යාපනය	0	2	0	0
210	උතුරු	යාපනය	යා/ වෙම්බඩි උසස් බාලිකා විද්‍යාලය,පළමු හරස් වීදිය, යාපනය.	0	2	0	1
211	උතුරු	කිලිනොච්චිය	කිලි/ කිලනොච්චි ම.ම.වි.ආනන්දපුරම් - බටහිර, කිලිනොච්චි	0	3	0	0
212	උතුරු	කිලිනොච්චිය	කිලිනොච්චි හින්දු විද්‍යාලය,ජාන්තිනගර්, කිලිනොච්චි	0	2	0	0
213	උතුරු	කිලිනොච්චිය	තර්මපුරම් මහා විද්‍යාලය,තර්මපුරම්, පරන්තන්	0	2	0	0
214	උතුරු	මන්නාරම	එරුක්කන්පිඩ්ඩි මුස්ලිම් ම. ම. වි.එරුක්කම්පිඩ්ඩි, මන්නාරම	0	2	0	1
215	උතුරු	මන්නාරම	මුරුන්කාන් ම.වි.මුරුන්කාන්, මන්නාරම	0	3	0	0
216	උතුරු	මුලතිව්	මු/ විද්‍යානන්ද විද්‍යාලය,මුල්ලියාවේලෙයි	0	2	0	0
217	උතුරු	මුලතිව්	ඔඩ්ඩුසුඩාන් ම.ම.වි.විද්‍යාපුරම්, ඔඩ්ඩුසුඩාන්	0	3	0	0
218	උතුරු	වව්නියා	ව/ වෙඩ්ඩිකුලම් ම.වි.වෙඩ්ඩිකුලම්	0	3	0	2
219	උතුරු	වව්නියා	වව්නියා දෙමල විද්‍යාලය,වවුනියාව	0	2	0	0
220	උතුරු	වව්නියා	මඩුකන්ද ජාතික පාසල,මඩුකන්ද, වවුනියාව	2	0	0	0
			එකතුව	**164**	**102**	**99**	**26**

11. දැනට රජයේ සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 13 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

12. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

13. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

14. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

ඩබ්ලිව්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 21 වැනි දින.
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අධ්‍යාපන අමාත්‍යාංශය

අ. පො. ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ
ජෛව පද්ධති තාක්ෂණවේදය හා තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා
උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම-2015
Recruitment of Graduates to Grade 3 – 1 (a) of Sri Lanka Teachers' Service for Sinhala and Tamil Media Teacher Vacancies existing in the subjects of Bio Systems Technology and Science for Technology of the New Technology Stream of G.C.E. (Advanced Level) – 2015

01 භාෂා මාධ්‍යය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල මාධ්‍ය - 2
දෙමළ මාධ්‍ය - 3

02. ඉල්ලුම් කරනු ලබන විෂයය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව (කෘෂි විද්‍යා උපාධිධාරීන්) - 1
තාක්ෂණය සඳහා විද්‍යාව විෂය ධාරාව (භෞතික විද්‍යා උපාධිධාරීන්) - 2

03.

	අනුක්‍රමික අංකය	පළාත	පාසලේ නම
1			
2			
3			

(උපලේඛනය 1 සඳහන් අයුරින් ඉල්ලුම් කරනු ලබන පාසල් 03 හා ඊට අදාළ අනුක්‍රමික අංකය මනාපයේ අනුපිළිවෙලින් මෙහි ලියන්න. මෙම අනුපිළිවෙළ කිසිදු අයුරකින් වෙනස් කරනු නොලැබේ.)

04.

4.1 සම්පූර්ණ නම (ඉංග්‍රිසි කැපිටල් අකුරින්)(උදා:-AMRAKOON MUDIYANSELAGE NAMAL HERATH) :————.

4.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම(ඉංග්‍රිසි කැපිටල් අකුරින්)(උදා:-HERATH.A.M. N) :——————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. වර්තමාන ලිපිනය :- (ඉංග්‍රිසි කැපිටල් අකුරින්) :————.
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

07.

7.1 ස්ත්‍රී / පුරුෂභාවය : (ස්ත්‍රී-1 පුරුෂ-0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

7.2 විවාහක /අවිවාහක බව : අවිවාහක -1 විවාහක -2 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

7.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

7.4 2015-12-21 දිනට වයස : අවු. : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර

අ. පො. ස. (සා.පෙළ) විභාගය *වර්ෂය :* *විභාග අංකය :*		*අ. පො. ස. (උ.පෙළ) විභාගය* *වර්ෂය :* *විභාග අංකය :*
1	5	
2	6	
3	7	
4	8	

09. උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :

9.1 උපාධිය :————.
9.2 නිකුත් කළ විශ්ව විද්‍යාලය :————.
9.3 උපාධිය වලංගු දිනය :————.
9.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.
9.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :————.

10.0

10.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.
10.2 කුවිතාන්සියේ අංකය :————.
10.3 නිකුත් කළ කාර්යාලය :————.
10.4 දිනය :————.

කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න,
මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ එහා එක් දාරයකින්
මෙහි අලවන්න.

11. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි, මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි, තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මහතා /මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ..... දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ශාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

_____

අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

13. අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

..... මහතා /මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික /අනියම් සේවකයකු /සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි /නොහැකි බවත් දන්වමි.

_____,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11-574/1

අධ්‍යාපන අමාත්‍යාංශය

අ. පො. ස. (උසස් පෙළ) නව තාක්ෂණ විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය සඳහා පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා තාක්ෂණික ගුරුවරුන් බඳවා ගැනීම-2015

Recruitment of Sinhala and Tamil Medium Technology Teachers for Teacher Vacancies Existing in the Engineering Technology of the New Technology Stream of G.C.E. (Advanced Level) – 2015

අ. පො. ස. (උසස් පෙළ) නව තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ තාක්ෂණ විද්‍යාගාර සහිත ද්විතියික පාසල්වල ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ඉගැන්වීම සඳහා පවතින සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් යාන්ත්‍රික තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය, විදුලිය සහ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය හා මෙගාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1 යෝග්‍යතා :-

1.1 සාමාන්‍ය සුදුසුකම්

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,

(ii) යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(iii) 2015-12-21 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 නොවැඩි විය යුතුය.